**<u>දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ව්‍යවස්ථාවට අයත් පෙර පාසල් ගුරු තනතුර සඳහා ලියාපදිංචි කර ගැනීම</u>**

දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් ගුරු තනතුර සඳහා සේවා අවශ්‍යතාවය මත දෛනික වැටුප් ගෙවීමේ පදනම මත ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- **පෙර පාසල් ගුරු තනතුරු** 06 - මෙම තනතුරට පහත සඳහන් **අධ්‍යාපන සුදුසුකම්** සපුරාලිය යුතුය.

  i සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

  සහ

  Ii අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී එක් විෂයකින් (01) හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

  - මෙම තනතුරට පහත සඳහන් **වෘත්තීය සුදුසුකම්** සපුරාලිය යුතුය රජයේ පිළිගත් ආයතනයකින් පෙර පාසල් ඉගැන්වීම පිළිබඳ ලබා ගත් එක් අවුරුදු ඩිප්ලෝමාවක් හදාරා තිබීම.

උක්ත තනතුර සඳහා අනෙකුත් සුදුසුකම් පහත පරිදි විය යුතුය.

**කායික සුදුසුකම්** : දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**වෙනත් සුදුසුකම්** :

1) ශ්‍රී ලංකා පුරවැසියකු වීම.

2) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

3) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. පදිංචි ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශිය ලේකම් විසින් අනු අත්සන් කර, නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය.

4) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**වයස** : අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු,

උපරිම සීමාව : අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය** : (1) මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යවහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරේ. මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලැබූ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ. (මෙය තීරණය වන්නේ ලැබෙන අයදුම්පත් ප්‍රමාණය මතය.)

(2) මෙය සේවා අවශ්‍යතාවය මත සිදු කරනු ලබන ලියාපදිංචි කර ගැනීමක් වන අතර, 2026.12.31 දක්වා පමණක් ලියාපදිංචි කර ගැනීමකි.

(3) රා.ප.ච. 10/2025 අනුව MN-1 තනතුරට අදාළව දෛනික වැටුප් ගෙවීමේ පදනම මත ලියාපදිංචි කර ගැනීම.

**අයදුම්පත් එවිය යුතු ආකාරය** : මේ සමග සඳහන් කර ඇති අයදුම්පත අනුව ඔබ විසින් A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතා කර සකස් කර ගත් අයදුම්පත් 2026 ජූලි මස 10 දිනට ප්‍රථම ලියාපදිංචි තැපැල මගින් හෝ සතියේ වැඩ කරන දිනක පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා භාර දී, භාර දුන් බවට කුවිතාන්සියක් ලබා ගන්නා ලෙසත්, ලිපි කවරයේ වම් පස ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කර එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

**අයදුම්පත සමග එවිය යුතු ලේඛන** : උප්පැන්න සහතිකයේ පිටපතක්/ ජාතික හැඳුණුම්පතෙහි පිටපතක්/ අධ්‍යාපන සහතිකවල පිටපත්/පදිංචි සහතිකයේ පිටපතක්/වෘත්තිය සුදුසුකම් සහිත සහතිකයේ පිටපතක්/පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්

සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් අවසන් තීරණ ලබා ගැනීම ප්‍රාදේශීය සභා සභාපතිගේ තීරණය මත වෙනස් විය හැකිය.

රුවන් වික්‍රමආරච්චි,

සභාපති,

දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

දිනය : 2026.06.17 දින.

**.......................................................................... තනතුර සඳහා ලියාපදිංචි කර ගැනීමේ අයදුම්පත්‍රය**

01. සම්පූර්ණ නම : ..........................................................................

..........................................................................

02. මුලකුරු සමග නම : ..........................................................................

03. ජාතිය : ..........................................................................

04. පුද්ගලික ලිපිනය : ..........................................................................

..........................................................................

05. දුරකතන අංකය : ..........................................................................

06. උපන් දිනය : ..........................................................................

07. ජාතික හැඳුණුම්පත් අංකය : ..........................................................................

08. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා/පෙළ) විභාගය

..........................................................................

..........................................................................

..........................................................................

..........................................................................

..........................................................................

..........................................................................

..........................................................................

..........................................................................

අ.පො.ස. (උසස්/පෙළ) විභාගය

..........................................................................

..........................................................................

..........................................................................

09. වෘත්තිය සුදුසුකම් : ..........................................................................

10. වෙනත් සුදුසුකම් : ..........................................................................

11. පළපුරුද්ද : ..........................................................................

මා විසින් සඳහන් කරන ලද සත්‍ය හා නිවැරදි බවටත්, සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර නොමැති බවටත් සහතික කරමි.

දිනය : 202.................... ......................................................

අයදුම්කරුගේ /අයදුම්කාරියගේ අත්සන